සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

## සාමාන්‍ය පොදු පරීක්ෂණය

12 13 ශ්‍රේණි

කාලය පැය 02 යි මිනිත්තු 30 යි.

උපදෙස් :-
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 - 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට 1, 2, 3, 4, 5 යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන එය ලකුණු කරන්න.
- එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 ක් හිමි වේ.

---

(01) පහත සඳහන් බලශක්ති ප්‍රභව අතුරෙන් ආහාර පිසීම සඳහා දැනට ශ්‍රී ලංකාවේ බහුලවම භාවිතා වන්නේ කවරක් ද?

(1) දර (2) විදුලිය

(3) ද්‍රව පෙට්‍රෝලියම් වායුව (LP ගෑස්) (4) ජීව වායුව

(5) භූමිතෙල් (......)

(02) පහත සඳහන් පරිසර ගැටලු අතරෙන් කවරක් දැනට ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල උග්‍ර ප්‍රශ්නයක් වී තිබේ ද?

(1) හරිතාගාර ආවරණය (2) ඕසෝන් ස්ථරය ක්ෂය වීම

(3) අම්ල වැසි ඇතිවීම (4) රසායනික පොහොර පානීය ජලයට මුසු වීම

(5) කැලි කසල එක්රැස්වීම (......)

(03) සමාජය තුළ ඒඩ්ස් රෝගය පැතිර යෑමට වඩාත් ම තුඩු දෙන ක්‍රියාවලිය පහත සඳහන් ඒවායින් කවරක් ද?

(1) මිතුරු මිතුරියන් අතිනතින් අල්ලාගෙන සිටීම.

(2) මදුරු දැල් භාවිත නොකිරීම.

(3) බොහෝ දෙනෙකු විසින් පානය කිරීම සඳහා කෝප්ප හවුලේ පාවිච්චි කිරීම.

(4) බොහෝ දෙනෙකු විසින් හවුලේ තුවා පාවිච්චි කිරීම.

(5) බොහෝ දෙනෙකු විසින් රැවුල බෑම සඳහා බ්ලේඩ් තල හවුලේ පාවිච්චි කිරීම. (......)

(04) ශ්‍රීමත් ආතර් සී. ක්ලාක් ශ්‍රී ලංකාවේ වාසය කළ ලෝක ප්‍රසිද්ධ පුද්ගලයෙකි. පහත සඳහන් ඒවා අතුරෙන් ඔහුට අදාළ නොවන්නේ කුමක් ද?

(1) ඔහු එක්සත් රාජධානියේ විශ්‍රාම ගිය තානාපතිවරයෙකි.

(2) ඔහු විද්‍යා ප්‍රබන්ධ රචකයෙකි.

(3) ඔහු සන්නිවේදන චන්ද්‍රිකාවේ පුරෝගාමියෙකි.

(4) ඔහු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකි.

(5) ඔහු නයිට් නාමයකින් පිදුම් ලැබූවෙකි. (......)

(05) ''අරාබි වසන්තය'' නම් වූ දේශපාලන ක්‍රියාවලියේ බලපෑමට හසු නොවූයේ, පහත සඳහන් රටවල් අතරින් කිනම් රට ද?

(1) සවුදි අරාබිය (2) ලිබියාව (3) සිරියාව (4) ඊජිප්තුව (5) යේමනය (......)

(06) එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ ජන්ම ශත සංවත්සරය යෙදෙන දිනය වන්නේ,

(1) 2014 ජූනි 03 (2) 2014 ජූලි 13 (3) 2014 අගෝස්තු 02
(4) 2015 ජනවාරි 05 (5) 2015 දෙසැම්බර් 03 (......)

(07) පහත සඳහන් යුගල අතරින් නොගැළපෙන ලෙස දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.

(1) ලියනාඩෝ ඩාවින්චි චිත්‍ර ඇඳීම (2) අයින්ස්ටයින් භෞතික විද්‍යාව
(3) ලෙස්ටර් ජේම්ස් පීරිස් දේශපාලනය (4) තෙන්ඩුල්කාර් ක්‍රිකට්
(5) ආනන්ද කුමාරස්වාමී සංස්කෘතිය (......)

(08) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව කුමක් ද?

(1) රගර් (2) පාපන්දු (3) ක්‍රිකට් (4) මලල ක්‍රීඩා (5) අත්පන්දු (......)

(09) හියුගෝ චාවේස් කුමන රටක ජනාධිපති වූයේ ද?

(1) චිලී (2) බ්‍රසීලය (3) ආජන්ටිනාව (4) වෙනිසියුලාව (5) බොලිවියාව (......)

(10) නොබෙල් ත්‍යාගයක් පිරිනමන්නේ නැති ක්ෂේත්‍රය වන්නේ,

(1) භෞතික විද්‍යාව (2) කායික විද්‍යාව (3) සාහිත්‍යය
(4) සාමය (5) ඉංජිනේරු විද්‍යාව (......)

(11) නෙළුම් පොකුණ අප රටට ලැබුණේ පහත කිනම් රටෙන් ද?

(1) ජපානය (2) ඇමරිකාව (3) ඕස්ට්‍රේලියාව (4) එංගලන්තය (5) මහජන චීනය (......)

(12) ලෝක ප්‍රකට සංගීතඥයකු වූ රවිශංකර් මිය ගිය රට හා වර්ෂය නිවැරදිව දැක්වෙන්නේ,

(1) ඉන්දියාවේදී 2012 දෙසැම්බර්
(2) ජපානයේදී 2013 දෙසැම්බර්
(3) ශ්‍රී ලංකාවේදී 2012 දෙසැම්බර්
(4) ඇමරිකා එක්සත් ජනපදයේදී 2012 දෙසැම්බර්
(5) රුසියාවේදී 2014 දෙසැම්බර් (......)

(13) 2014 දී යුනෙස්කෝව (UNESCO) ශ්‍රී ලංකාවේ විද්වතෙකුගේ 100 වැනි උපන්දිනය සමරයි. ඔහු කවරෙක් ද?

(1) මාටින් වික්‍රමසිංහ (2) එදිරිවීර සරච්චන්ද්‍ර (3) කේ. ජයතිලක
(4) ජේ.බී. සේනානායක (5) පියදාස සිරිසේන (......)

(14) පහත සඳහන් අය අතරින් ශ්‍රී ලංකාවේ සම්භවයක් ඇති කීර්තිමත් චිත්‍ර ශිල්පියෙකු නොවන්නේ කවුරුන් ද?

(1) ජෝර්ජ් කීට් (2) ඩේවිඩ් පේන්ටර් (3) අයිවන් පීරිස්
(4) ආනන්ද කුමාරස්වාමී (5) ජේ.ඩී.ඒ. පෙරේරා (......)

(15) නීතියේ දී රිට් ආඥාවක් යනු පුද්ගලයකුට යම් ක්‍රියාවක් කිරීමට හෝ කිරීමෙන් වැළකී සිටීමට හෝ ලිඛිත උසාවි නියෝගයකින් කෙරෙන දැනුම්දීමකි. සර්ටියොරාරි (CERTIORARI) රිට් ආඥාවකින් නියෝග කෙරෙන්නේ කුමක් ද?

(1) නියම කරන ලද දිනක උසාවියේ පෙනී සිටීම ය.
(2) පොලිස් අත්අඩංගුවේ පසුවන පුද්ගලයෙකු නිදහස් කිරීමය.
(3) පහළ උසාවියක අසන ලද නඩුවක වාර්තා ඉදිරිපත් කිරීමය.
(4) පුද්ගලයෙකු සිරගත කිරීමය.
(5) දඩයක් ගෙවීමය. (......)

The National e-Learning Portal for The General Education

- **අංක 16 සහ 17 ප්‍රශ්න පහත දැක්වෙන අංකනය මත පදනම් වේ.**

X + Y මඟින් Y ට වඩා X උසින් වැඩි බව ද,

X . Y මඟින් Y ට වඩා X මිටි බව ද,

X - Y මඟින් X ගේත්, Y ගේත් උස සමාන බව ද අදහස් කෙරේ.

(16) A + B - C . D මඟින් අදහස් වන්නේ,

(1) උසම පුද්ගලයා A හෝ D බවයි. (2) උසම පුද්ගලයා B හෝ D බවයි.
(3) මිටිම පුද්ගලයා C හෝ D බවයි. (4) C ට වඩා B මිටි බවයි.
(5) C ට වඩා D මිටි බවයි. (......)

(17) A . B + C + D - E මඟින් අදහස් වන්නේ,


(1) උසම පුද්ගලයා A බවයි. (2) උසම පුද්ගලයා B බවයි.
(3) B ගේත්, E ගේත් උස සමාන බවයි. (4) C ගේත්, D ගේත් උස සමාන බවයි.
(5) මිටිම පුද්ගලයා E බවයි. (......)

(18) බ්‍රිතාන්‍ය කිරීටයෙන් ශ්‍රී ලංකාවට නිදහස ලැබුණු 1948 පෙබරවාරි 04 වැනිදා සතියේ කිනම් දවසක් වී ද?

(1) සඳුදා (2) අඟහරුවාදා (3) බදාදා (4) බ්‍රහස්පතින්දා (5) සිකුරාදා (......)

(19) පහත දැක්වෙන රූප සටහනෙහි ත්‍රිකෝණ කීයක් වේද?




(1) 29
(2) 27
(3) 25
(4) 23
(5) 21





(......)


(20) සිරිපාල ගුනපාල මෙන් දෙගුණයක් වේගයෙන් දුවයි. එක්තරා මොහොතකදී ගුනපාල සිරිපාලට මීටර් 200 ක් ඉදිරියෙන් සිටින අතර, තත්පර 50 කින් පසුව සිරිපාල ගුනපාල පසුකර යයි. තත්පර 40 කදී ගුනපාල දුවන දුර කොපමණ ද?


(1) මීටර් 140 (2) මීටර් 150 (3) මීටර් 160 (4) මීටර් 170 (5) මීටර් 180 (......)


(21) එක්තරා අයුරකින්  රූපය  රූපයට සම්බන්ධ වෙයි. පහත O දැක්වෙන • රූපවලින් කුමක් ඒ අයුරින්ම  රූපයට සම්බන්ධ වේ ද?

(1) 

(2) 

(3) 

(4) 

(5) 

(......)

The National e-learning Portal for The General Education

- **අංක 22, 23 සහ 24 එක් එක් ප්‍රශ්නයෙහි වාක්‍ය තුනකින් යුක්ත කෙටි ඡේද 05 ක් තිබේ. ඒවායින් එක ඡේදයක, වාක්‍ය තුන තර්කානුකූල අයුරින් ගළපා තිබේ. එම ඡේදය කුමක් ද?**

(22) (1) ගෙදරින් මට විදුලි පණිවිඩයක් එවා තිබුණි. ඊළඟ සති අන්තයේ ගෙදර එන්න යැයි අම්මා කියා තිබුණි. ලිපියක් එවනවාට වඩා විදුලි පණිවිඩයක් එවීම ඉක්මන්ය.

(2) ගෙදරින් මට විදුලි පණිවිඩයක් එවා තිබුණි. වහාම ගෙදර එන්න යැයි අම්මා කියා තිබිණි. පවුලේ ප්‍රශ්ණයක් ගැන මා සමඟ කථා කරන්නට ඇයට වුවමනා වී ඇත.

(3) ගෙදරින් මට විදුලි පණිවිඩයක් එවා තිබිණි. ඊළඟ ඉරිදා ගෙදර එන්න යැයි අම්මා කියා තිබුණි. විදුලි පණිවිඩ එවීම අම්මාගේ පුරුද්දය.

(4) ගෙදරින් මට විදුලි පණිවිඩයක් එවා තිබිණි. මට ගෙදර එන්න යැයි අම්ම කියා තිබිණි. ඇය සාමාන්‍යයෙන් මට එවන්නේ ලිවුම්ය.

(5) ගෙදරින් මට විදුලි පණිවිඩයක් එවා තිබිණි. මා ගෙදර නොසිටි කාලයේ දී සිදු වූ දෙයක් අම්මා මට දන්වා තිබිණි. සෑම සති අන්තයේදීම ඇය මට දුරකථනයෙන් කතා කරන්නීය.

(......)

(23) (1) සමහර විට ඉතා සුළු දේට ලසන්ති කෝප වන්නී ය. කෝප නොවී සිටින විට ඇය කවි ලියන්නීය. හොඳ කිවිඳියක් වීමට ඇය උත්සාහ කරන්නීය.

(2) ලසන්ති කවි ලියන්නීය. ඒවා කියවීමට ඇය නොදන්නීය. මම ඒවා අගය කරන්නෙමි.

(3) ලසන්තිට හොඳ කවි රසඥතාවයක් තිබේ. ඇය පොත් කියවන්නීය. සමහර විට ඇය හොඳ කවි පොත් මිල දී ගන්නීය.

(4) ලසන්ති කවි ලියන්නීය. ඇය කෙටි කථා ද ලියන්නීය. ඇයට හොඳ කවි පොත් එකතුවක් තිබේ.

(5) ලසන්ති කවි ලිවීමට දක්ෂය. ඇය නවකථා මිලදී ගන්නීය. ඇගේ යෙහෙළියන් ද කවි ලිවීමට උනන්දුය.

(......)

(24) (1) මම ඉංග්‍රීසි ඉගෙනීමට කැමැත්තෙමි. මම උපකාරක පන්තියට යමි. මගේ හොඳම මිතුරාද මේ පන්තියට පැමිණෙයි.

(2) කමල් මගේ හොඳ මිතුරා වෙයි. ඔහු මට ඉතා කැමතිය. ඔහු නිතිපතා උපකාරක පන්තියට පැමිණෙයි.


(3) උසස් අධ්‍යාපනය සඳහා ඉංග්‍රීසි ඉතා ප්‍රයෝජනවත් භාෂාවක් වේ. මම ඉංග්‍රීසි ඉගෙනීමට ඉතා කැමැත්තෙමි. මම නිතිපතා ඉංග්‍රීසි පන්තිවලට සහභාගී වන්නෙමි.

(4) කමල් ඉංග්‍රීසි උගනියි. ඔහු ප්‍රංශ භාෂාව ද උගනියි. ඔහුගේ මව ජර්මන් භාෂාව උගන්වයි.

(5) මගේ මව භාෂා ගුරුවරියක් වන්නීය. ඇය ද්විතීයික පාඨශාලාවක උගන්වන්නීය. මම ඉංග්‍රීසි හැදෑරීමට තීරණය කර ඇත්තෙමි.


(......)

(25) රූපයේ පෙන්නුම් කර ඇති පරිදි, සරල රේඛා තුනක් පමණක් මගින් වෘත්තයක් බෙදිය හැකි උපරිම කලාප සංඛ්‍යාව 07 කි. සරල රේඛා 04 ක් මඟින් වෘත්තයක් බෙදිය හැකි උපරිම කලාප සංඛ්‍යාව කොපමණ ද?




(1) 9 (2) 10 (3) 11
(4) 12 (5) 13 (......)

(26) මෙහි දක්වෙන රූප සටහනේ ඉඩමක් දක්වේ. එහි පරිමිතිය වන්නේ,





(1) 62m
(2) 120m
(3) 122m
(4) 124m
(5) 130m (......)

(27) (A) හා (B) මඟින් දක්වා ඇති සංඛ්‍යා රටාව තේරුම් ගෙන (C) වල ? ලකුණ දක්වා ඇති තැනට සුදුසු අංකය යොදන්න.





(1) 275 (2) 250 (3) 225 (4) 215 (5) 195 (......)

(28) මේ ප්‍රශ්නය පදනම් වන්නේ මිනිස් සිරුරක සංයුතිය දැක්වෙන පහත රූප සටහන මතය. සිරුරේ මුළු බර 60kg නම් ජලය, ප්‍රෝටීන් හා මේදය යන කොටස්වලට අයත් නොවන ශේෂයේ බර කොපමණ ද?




(1) 3kg
(2) 4kg
(3) 5.5kg
(4) 6kg
(5) ඉහත ඒවායින් එකක්වත් නොවේ. (......)

(29) පහත දැක්වෙන රූපය මගින් ළමයෙකු ක්‍රීඩාවක් සඳහා චතුරස්‍ර 02 ක් සකස් කර ගැනීමට සමාන දිගකින් යුත් කෝටු 07 ක් යොදාගෙන ඇති ආකාරය දක්වයි. මේ අන්දමට සමාන චතුරස්‍ර 08 ක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන සමාන දිගින් යුත් අවම කෝටු ගණන කීයද?



(1) 14 (2) 16 (3) 18 (4) 20 (5) 22 (......)

(30) කිසියම් ඉලක්කම් 06 ක සාමාන්‍ය 10 වන අතර වෙනත් ඉලක්කම් 10 ක සාමාන්‍ය 06 වේ. ඉලක්කම් 16 යේම සාමාන්‍ය කීයක් වේද?

(1) 7¾ (2) 7½ (3) 7¼ (4) 6¾ (5) 6½ (......)

(31) සමචතුරස්‍රයක පැත්තක දිග 100% කින් වැඩි වූයේ නම් එම සමචතුරස්‍රයේ ක්ෂේත්‍රඵලය වැඩිවනු ඇත්තේ,

(1) 100% කිනි. (2) 200% කිනි. (3) 300% කිනි. (4) 400% කිනි. (5) 500% කිනි. (......)

(32) සෑම දිනකම තමන් කරන වැඩ වෙනුවෙන් රවීට රු. 30 ක් හෝ ඉතා හොඳින් කළ විට රු. 50 ක් හෝ ලැබෙයි. දවස් 10 ක් වැඩ කළ පසු රවීට රු. 360 ක් ලැබිණි. රවී දවස් කීයක් තම වැඩ ඉතා හොඳින් කර තිබේද?

(1) 3 (2) 4 (3) 5 (4) 6 (5) 7 (......)

- **අංක 33, 34 සහ 35 යන ප්‍රශ්නවල X හා Y යනුවෙන් ප්‍රකාශ දෙකක් දී ඇත. පහත දැක්වෙන උපදෙස් අනුව එක් එක් ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.**

⋆ X හා Y දෙකම සත්‍ය නම් ද, Y යනු X හි නිවැරදි පැහැදිලි කිරීම් නම් ද A තෝරන්න.

⋆ X හා Y යන දෙකම සත්‍ය නම් ද, Y යනු X හි නිවැරදි පැහැදිලි කිරීම නොවේ නම් ද B තෝරන්න.

⋆ X සත්‍ය නම් හා Y අසත්‍ය නම් C තෝරන්න.

⋆ X හා Y යන දෙකම අසත්‍ය නම් E තෝරන්න.

⋆ X අසත්‍ය නම් හා Y සත්‍ය නම් D තෝරන්න.

(33) X : පළිබෝධනාශක මඟින් පරිසරය දූෂණය කෙරෙයි.

Y : පළිබෝධනාශකවල රසායන ද්‍රව්‍ය අන්තර්ගතය,

(1) A (2) B (3) C (4) D (5) E (......)

(34) X : පෞද්ගලික නිදහස සහ කෙනෙකුගේ සදාචාරාත්මක වගකීම එකිනෙකට ප්‍රතිවිරුද්ධ හැඟීම් ජනිත කරයි.

Y : යමෙකුට සදාචාරාත්මක වගකීම තිබේ නම් ඔහුට නිදහස භුක්ති විඳිය නොහැකිය.

(1) A (2) B (3) C (4) D (5) E (......)

(35) X : ශ්‍රී ලංකාව බොර තෙල් සැලකිය යුතු ප්‍රමාණයක් ආනයනය කරයි.

B : ශ්‍රී ලංකාව බොරතෙල් නිෂ්පාදනය කරයි.

(1) A (2) B (3) C (4) D (5) E (......)

(36) චීටෙකු ගමනක පළමුවන පැය දෙකෙහිදී පැයට කිලෝමීටර් 5 ක වේගයෙන් යයි. අනතුරුව වේගය පැයට 3km තෙක් අඩුවෙයි. 20km ක දුරක් යාමට චීටාට කොපමණ කාලයක් අවශ්‍ය වේ ද?

(1) පැය 04 (2) පැය 05 (3) පැය 05 1/3 (4) පැය 05 1/2 (5) පැය 05 2/3 (......)

(37) වර්තමානයේ ලෝකයේ විශාලතම ආර්ථික පද්ධති සතු රටවල් හතරම අඩංගු වන්නේ පහත සඳහන් කවර පිළිතුරේ ද?

(1) ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ජපානය, ඉන්දියාව.
(2) එක්සත් රාජධානිය, බ්‍රසීලය, ඉන්දියාව, චීනය.
(3) ඇමරිකා එක්සත් ජනපදය, චීනය, ජපානය, ඉන්දියාව.
(4) ඉන්දියාව, ජපානය, චීනය, රුසියාව.
(5) බ්‍රසීලය, චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ඉන්දියාව. (......)

(38) නොරොච්චෝලේ විදුලි බල ව්‍යාපෘතියෙහි විදුලි බලය නිපදවීම සඳහා භාවිත කිරීමට යෝජිත බලශක්ති ප්‍රභවය පහත දැක්වෙන ඒවා අතරින් කුමක් ද?

(1) හිරු එළිය (2) ගල් අඟුරු (3) සුළං බලය (4) ඩීසල් (5) දිය (......)

- **ප්‍රශ්න අංක 39 සහ 40 ප්‍රශ්නවල අක්ෂර කාණ්ඩ 04 ක් බැගින් දී ඇත. එක් එක් වරහන තුළට අක්ෂර දෙකක් ඇතුල් කළ විට, එම අක්ෂර දෙකෙන් අවසන් වන අර්ථවත් වචනයකුත්, එම අක්ෂර දෙකෙන් ඇරඹෙන අර්ථවත් වචනයකුත් ලැබේ. එම අක්ෂර දෙක ඇතුළත් යුගලය තෝරන්න.**

(39) මද (.......) රැළි නිද (.......) ගන
අද (.......) කත් කල (.......) රක්

(1) නළ (2) හන (3) හස (4) ලස (5) වන (......)

(40) වන (.......) මිතුරු අව (.......) සන පුර (.......) තුරු

(1) තුර (2) හස (3) මද (4) පස (5) ලිප (......)

- **ප්‍රශ්න අංක 41 හ 42 ප්‍රශ්නවල A සහ B යනුවෙන් දී ඇති පද යුගල දෙකෙහි එක එකක අඩංගු පද යුගලය අතර පවතින සම්බන්ධතාව අධ්‍යයනය කර, ඊට සමාන සම්බන්ධතාවයක් ඇති පද යුගල දෙක අයත් පිළිතුර තෝරන්න.**

(41) A : අධිකරණය නීතිය B : පොත පාඨකයා

(1) පුවත්පත ප්‍රවෘත්ති ; පූජකවරයා යාඥාව
(2) පුවත්පත ප්‍රවෘත්ති ; ක්‍රීඩා පිටිය ක්‍රීඩකයා
(3) ක්‍රීඩකයා ක්‍රිකට් ; ගුවන් විදුලිය ශ්‍රාවකයා
(4) දේවස්ථානය ආගම ; රූපවාහිනිය ටෙලි නාට්‍ය
(5) දේවස්ථානය ආගම ; ගුවන් විදුලිය ශ්‍රාවකයා (......)

(42) A : මල මල් බඳුන B : ගෙබිම බුමුතුරුව

(1) පින්තූරය තීන්ත ; හිස හිස්වැසුම

(2) අත වළල්ල ; කෝප්පය ජලය

(3) කැටයම ලෑල්ල ; පාද පාපිස්න

(4) ඡායාරූපය කැමරාව ; කලිසම ඉන

(5) පින්තූරය රාමුව ; ඇඳ ඇඳ ඇතිරිල්ල (......)

(43) අද සිරිමල්ගේ 12 වන උපන් දිනය ද, ඔහුගේ පියාගේ 40 වන උපන්දිනය ද වේ. සිරිමල්ගේ පියාගේ වයස සිරිමල්ගේ වයස මෙන් දෙගුණයකට සමාන වන්නේ අද සිට අවුරුදු කීයකට පසුවද?

(1) 12 (2) 14 (3) 16 (4) 18 (5) 20 (......)

(44) පැයට කිලෝමීටර් 60 ක වේගයෙන් ධාවනය වන දුම්රියත් තත්පර 9 ක දී සංඥා කණුවක් පසු කරයි. දුම්රියේ දිග මීටර් ?


(1) 120 කි. (2) 150 කි. (3) 160 කි. (4) 180 කි. (5) 190 කි. (......)


(45) මගේ ඔරලෝසුව මධ්‍යාහ්න 12 000 ට නිවැරදි වේලාව දක්වූ අතර එතැන් සිට පැයට මිනිත්තු 17 බැගින් අඩුවෙන් ක්‍රියාත්මක වී දැනට පැය හයකට පෙර මුළුමනින්ම නතර විය. එවිට එහි දැක්වෙන වේලාව පස්වරු 2.52 නම් දැන් වේලාව කීයද ?

(1) ප.ව. 11.00 (2) ප.ව. 10.00 (3) ප.ව. 9.00 (4) ප.ව. 3.00 (5) ප.ව. 2.00 (......)

- **ප්‍රශ්න අංක 46 සිට 47 යන එක් එක් ප්‍රශ්නය යටතේ ඉහළ පේළියේ දී ඇති රූප හතරෙහි දිස්වන සම්බන්ධතාව අනුව, ඊළඟට ගැළපෙන රූපය දී ඇති වරණ 05 අතුරෙන් තෝරන්න.**


(46)






(1) (2) (3) (4) (5) (......)

(47)





(1) (2) (3) (4) (5) (......)

(48) පෙරේදා (ඊයෙට පෙර දින) සහ පසුගිය සෙනසුරාදා අතර දින (සතියේ දවස්) තුනක් තිබුණි නම්, අද දවස කුමක් ද?

(1) අඟහරුවාදා (2) සඳුදා (3) බදාදා (4) බ්‍රහස්පතින්දා (5) සිකුරාදා (......)

(49) සංඛ්‍යා 15 ක සාමාන්‍ය (මධ්‍යනය) 90 කි. ඒවායින් මුල් සංඛ්‍යා 7 හි සාමාන්‍ය 87 ද අවසාන සංඛ්‍යා 7 හි සාමාන්‍ය 92 ද වේ 8 වන සංඛ්‍යාව කුමක් ද?

(1) 97 (2) 94 (3) 90 (4) 83 (5) 82 (......)

(50) වෙළෙන්දෙක් භාණ්ඩයක මිල 50% ක් වැඩියෙන් ලකුණු කර, එම ලකුණු කළ මිලෙන් 20% ක වට්ටමක් දෙයි. වට්ටම දීමෙන් පසු ඔහු ලබන ලාභය, මිල වැඩියෙන් ලකුණු කිරීමට පෙර භාණ්ඩයේ තිබූ මිලෙහි ප්‍රතිශතයක් ලෙස කොපමණ ද?

(1) 30% (2) 25% (3) 20% (4) 15% (5) 10% (......)

(51) ලෝකයේ වැඩිම මරණ සංඛ්‍යාවකට හේතුවෙන්නේ පහත දැක්වෙන කවරක් ද?

(1) දුම්කොළ (2) මධ්‍යසාර (3) හෙරොයින්

(4) මෝටර් රථ අනතුරු (5) මිනීමැරුම් (......)

(52) මධ්‍යසාර සමග සම්බන්ධ නොවන්නේ පහත දැක්වෙන කවරක් ද?

(1) අක්මා රෝග (2) හදිසි අනතුරු (3) මොළයේ උත්තේජනය

(4) හෘදයාබාධ (5) ප්‍රචණ්ඩත්වය (......)

(53) ''ඔබේ දුම්වැටිය මා මරා දමයි.'' යනු,

(1) වෛද්‍ය මතයකි.

(2) විද්‍යාත්මක සාක්ෂි පදනම් කරගත් නිගමනයකි.

(3) චිත්‍රපටයක නාමයකි.

(4) දුම් නොබොන්නන්ගේ විශ්වාසයකි.


(5) පාසල් ශිෂ්‍යාවන් බිය ගැන්වීම සඳහා වෛද්‍යවරුන් විසින් නිර්මිත කියමනකි. (......)

(54) එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර සාමාජිකයෙකු නොවන්නේ පහත දැක්වෙන කවර රටද?


(1) චීනය (2) එක්සත් රාජධානිය (3) ඇමරිකා එක්සත් ජනපදය

(4) ඉන්දියාව (5) රුසියාව (......)

- **අංක 55, 56 සහ 57 ප්‍රශ්න පහත දැක්වෙන තොරතුරු මත පදනම් වේ.**




- එක් එක් පීඨයන්හි ශිෂ්‍ය ප්‍රතිශතය




- කලා පීඨයෙහි විදේශීය ශිෂ්‍ය ප්‍රතිශතය

ඉහත දී ඇති වට සටහන් (Pie charts) මගින් අන්තර්ජාතික විශ්ව විද්‍යාලයක එක් එක් පීඨයෙහි සිටින ශිෂ්‍ය ප්‍රතිශතයත්, කලා පීඨයෙහි සිටින විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාවත් දැක්වෙයි. කලා පීඨයෙහි සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1120 කි.

(55) වෛද්‍ය පීඨයෙහි සිටින ශිෂ්‍යයන් ගණන කීයද?

(1) 224 (2) 220 (3) 30 (4) 150 (5) 170 (......)

(56) විශ්ව විද්‍යාලයේ සිටින මුලු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

(1) 4450 (2) 4460 (3) 4480 (4) 4560 (5) 4680 (......)

(57) යුරෝපීය වෛද්‍ය ශිෂ්‍යයෝ 28 දෙනෙකු සිටිති. මුලු වෛද්‍ය ශිෂ්‍යයන්ගෙන් කවර ප්‍රතිශතයක් ඔවුන් නිරූපණය වේ?

(1) 2.8% (2) 7.5% (3) 12.5% (4) 15% (5) 20% (......)

(58) අවසාන රූපයේ දක්වා ඇති ප්‍රශ්නාර්ථ ලකුණට හිමි වටිනාකම කීයද?




(1) 40 (2) 41 (3) 42 (4) 43 (5) 44 (......)

(59) සිසුන් 180 ක් ශ්‍රවණාගාරයක සෑම පේළියකටම සමාන ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටින සේ පේළි කිහිපයක වාඩි කළ යුතුව ඇත. පහත දී ඇති පේළි සංඛ්‍යාවෙන් වැරදි වන්නේ කිනම් සංඛ්‍යාවද?

(1) 4 (2) 20 (3) 30 (4) 40 (5) 90 (......)

(60) අනුගාමී ඉරට්ටේ සංඛ්‍යා 06 ක ඓක්‍යය 402 වේ. එම සංඛ්‍යා හයෙන් එක සංඛ්‍යාවක් වනුයේ,

(1) 54 ය. (2) 62 ය. (3) 74 ය. (4) 82 ය. (5) 94 ය. (......)

The National e-learning Portal - The General Education